# බුදුගල පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**රත්නසිරි.ඒ.ඒ.කේ.**[1]

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුදුගල පුරාවිද්‍යා ස්ථානය පිහිටා තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් චිත්‍ර පිළිබඳ අධ්‍යයනය කරන විට බුදුගල පුරාවිද්‍යා ස්ථානය ඉතා වැදගත් වේ. එහි ඇති මාළු අල්ලමින් සිටින මිනිසුන් දෙදෙනා, ත්‍රිශූලයක සලකුණ, ස්වස්ථික සලකුණ හා සිංහ රූපය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වන බව විද්වත්හු විසින් විශ්වාසය එළකර තිබේ. එසේ ම බුදුගල ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික මානවයින් වාසය කළ බවට සාධක රැසක් හඳුනාගැනීමට හැකි වේ. බුදුගල කඳු ශිඛරය වලවේ ගංගා නිම්නයෙන් ඉහළ නැගුනු ආනතියකින් යුතු කුරගල හා හිටුවන්ගල යන ප්‍රධාන කඳු ශිඛරවලට පහළින් පිහිටා තිබේ. කුරගල යනු ප්‍රාග් ඓතිහාසික සාධක රැසක් හමු වූ ස්ථානයකි. මීට අමතරව උඩුපියන් ගල්ගේ, බෙල්ලන්බැදි පැලැස්ස, උඩ රංචමඩම, හෝර්ටන් තැන්න, රාවණා ඇල්ල මීට ආසන්නයෙන් පිහිටි ප්‍රාග් ඓතිහාසික වැදගත්කම් ඇති ස්ථාන වේ. ඓතිහාසික යුගය වන විට බුදුගල පුරාවිද්‍යා ස්ථානය පධානඝර ආරාම සංකීර්ණයක් නිර්මාණය කර තිබේ. වංසකතාවල "පධානඝර" යනුවෙන් ද, ශිලා ලිපිවල "පතනගල" යනුවෙන් ද, මූලාශ්‍රවල "පියංගල්" වශයෙන් ද හඳුන්වන මෙම ආරාම සංකීර්ණය පැරණි වාස්තුවිද්‍යාවේ දියුණුව ලොවට කියාපායි. බුදුගල පධානඝර ආරාම සංකීර්ණය කුමන වකවානුවේ කවුරුන් විසින් නිර්මාණය කළේ ද යන්න නිශ්චිතව ම තහවුරු වී නොමැති අතර ඒ පිළිබඳ විවිධ මතවාද රැසක් පවතී. මහාවංශයේ රුහුණු ප්‍රදේශයේ පැවති පධානඝරයක් පිළිබඳ පනස් තුන්වැනි පරිච්ඡේදයේ සඳහන් වන අතර රුහුණේ මේ වන තෙක් සොයාගෙන ඇති එක ම තපෝවන පධානඝර ආරාම සංකීර්ණය බුදුගල පුරාවිද්‍යා ස්ථානයයි. ඒ අනුව මහාවංසයේ සඳහන් වන්නේ බුදුගල පධානඝර ආරාම සංකීර්ණය පිළිබඳ විය යුතු ය. බුදුගල පුරාවිද්‍යා ස්ථානයේ හමුවන චිත්‍ර හා කැටයම් අතර පහළ මළුවේ සංරක්ෂණය කරන ලද පධානඝරයෙන් හමුවන සංඛය සහිත සලකුණ, ස්වස්ථික සලකුණ සහ අලංකාර ශෛලමය නෙළුම් මල් මෝස්තර කැටයම ද ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනය තුළින් එනම් බුදුගල පුරාවිද්‍යා ස්ථානය තුළ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මානව ක්‍රියාකාරීත්වය කෙසේ සිදු වී ද, ඓතිහාසික යුගයේ දී පධානඝර ආරාම සංකීර්ණයක් ලෙස එය පරිසරයට අනුගත වෙමින් නිර්මාණය කර ඇත්තේ කෙසේ ද, බුදුගල පධානඝර ආරාම සංකීර්ණය අයත් කාලවකවානු පිළිබඳ මතවාද කෙබඳු ද යන්න මෙම අධ්‍යයනය මඟින් හඳුනාගෙන තිබේ.

**මුඛ්‍ය පද :** බුදුගල, පධානඝර, මහාවංසය, රුහුණ.

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. achinirathnasiri44@gmail.com